NATIONAL ACCOUNTING (Part-I)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

සාර්ව ආර්ථික අරමුණු

සමාජයක් විසින් සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන විවිධ අරමුණු සාර්ව ආර්ථික අරමුණු වශයෙන් හැඳින්වේ.

සාර්ව ආර්ථික අරමුණු පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

- පූර්ණ සේවා නියුක්තිය
- ආර්ථික ස්ථායිතාව
- සාධාරණත්වය
- ආර්ථික වර්ධනය
- තිරසර සංවර්ධනය

ClassWork.LK

<u>සාර්ව ආර්ථික විචල්‍යයන්</u>

සමස්ත ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බලපෑම් කරන මූලික විචල්‍යයන් සාර්ව ආර්ථික විචල්‍යයන් වේ.

සාර්ව ආර්ථික විචල්‍යයන් පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

- ○ සමස්ත නිමැවුම
- ○ සේවා නියුක්තිය
- ○ පොදු මිල මට්ටම
- ○ විනිමය අනුපාතිකය
- ○ පොලී අනුපාතිකය
- ○ ගෙවුම් ශේෂය
- ○ සේවා නියුක්තිය

ClassWork.LK

සාර්ව ආර්ථික ගැටලු

සාර්ව ආර්ථික විචල්‍යයන් අපේක්ෂිත මට්ටමට ළඟා නොවන අවස්ථාවල දී එනම් අනපේක්ෂිත සාර්ව ආර්ථික උච්චාවචනයන් ඇති වන විට දී සාර්ව ආර්ථික ගැටලු ඇති වේ.

සාර්ව ආර්ථික ගැටලු පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

- ආර්ථික පසු බැසීම් හා ආර්ථික ප්‍රසාරණය
- සේවා වියුක්තිය
- උද්ධමනය

ClassWork.LK

ආර්ථික පසු බැසීම් හා ආර්ථික ප්‍රසාරණය

ආර්ථික පසුබැසීම යනු කෙටි කාලීන (කාර්තු දෙකකට වඩා අඩු කාලයක දී සිදු වන) තත්ත්වය කි. ආර්ථිකයේ භාණ්ඩ හා සේවා සඳහා සමස්ත ඉල්ලුම අඩු වී නිෂ්පාදනය අඩු වීම මගින් ආර්ථික පසුබැසීම ඇති වේ.

ආර්ථික පසුබැසීම තුළින් සේවා වියුක්තිය ඉහළ යයි. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ ලක්ෂ්‍යයකින් ඇතුළට විතැන් වීමක් මගින් ආර්ථික පසුබැසීම පෙන්නුම් කළ හැකි ය.

ආර්ථික ප්‍රසාරණයේ දී ආර්ථිකයේ භාණ්ඩ හා සේවා සඳහා සමස්ත ඉල්ලුම වැඩි වී සමස්ත නිමැවුම ඉහළ යාම සිදු වේ.

ClassWork.LK

<u>සේවා වියුක්තිය</u>

ආර්ථිකයේ සමස්ත නිෂ්පාදන සාධක ඵලදායී ආකාරයෙන් නිෂ්පාදනය සඳහා උපරිම ලෙස භාවිත නොකිරීම සේවා වියුක්තිය යි.

<u>උද්ධමනය</u>

ආර්ථිකයක පොදු මිල මට්ටමෙහි අඛණ්ඩ ඉහළ යාම උද්ධමනය වශයෙන් හඳුන්වයි.

ClassWork.LK

ව්‍යාපාර චක්‍ර

සාර්ව ආර්ථික උච්චාවචන ව්‍යාපාර චක්‍රය ආශ්‍රයෙන් පෙන්නුම් කළ හැකි ය.

එසේ ම සාර්ව ආර්ථිකයේ කෙටි කාලීන හා දිගු කාලීන හැසිරීම්වල සම්බන්ධතාව අවබෝධ කර ගැනීමට ද ව්‍යාපාර චක්‍ර උපයෝගී කරගත හැකි ය.

කාලයත් සමඟ ආර්ථිකයේ මූර්ත දළ දේශීය නිෂ්පාදනයේ චක්‍රීය හැසිරීම ව්‍යාපාර චක්‍ර ලෙස හඳුන්වයි.

ව්‍යාපාර චක්‍රයක අවධි

- පසුබැසීමේ අවධිය
- පතුල
- ප්‍රසාරණ අවධිය
- මුදුනත

ClassWork.LK

ව්‍යාපාර චක්‍රයක අවධි ප්‍රස්තාර සටහනකින්



සැබෑ නිමැවුමෙන් සමස්ත ආර්ථිකයේ කෙටි කාලීන හැසිරීම පෙන්නුම් කරන අතර විභව නිමැවුමෙන් සමස්ත ආර්ථිකයේ දිගු කාලීන හැසිරීම පෙන්නුම් කරයි.

විභව නිමැවුම යනු ආර්ථිකයක සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයෙන් උපයෝජනය කළ විට උද්ධමන පීඩනයකින් තොරව ලබා ගත හැකි උපරිම වූත් තිරසර වූත් නිමැවුම් මට්ටම යි.

කාලයත් සමඟ විභව නිමැවුම වටා සැබෑ නිමැවුම දෝලනය වේ.

විභව නිමැවුමට පහළ සත්‍ය නිමැවුමේ පහළ ම අවස්ථාව පතුල හා විභව නිමැවුමට ඉහළ සැබෑ නිමැවුමේ ඉහළ ම අවස්ථාව මුදුනත වේ.

පතුලේ සිට මුදුනත දක්වා ගමන් කරන අවධිය නිමැවුමේ ප්‍රසාරණ අවධිය වේ.

මුදුනත සිට පතුල දක්වා ගමන් කරන අවධිය නිමැවුමේ පසුබැසීමේ අවධිය වේ.

ප්‍රසාරණ අවධිය පසුබැසීමේ අවධියට වඩා දීර්ඝ වේ.

ව්‍යාපාර චක්‍රයක එක් මුදුනක සිට තවත් මුදුනකට ඇති දුර ව්‍යාපාර චක්‍රයක කාලය වේ.

එකම ව්‍යාපාර චක්‍රයක මුදුනත් අතර දිග එකිනෙකට වෙනස් වේ.

ව්‍යාපාර චක්‍රයක දිගු කාලීන උපනති තත්ත්වයක් ද විභව නිමැවුම් මට්ටමෙහි පෙන්නුම් කරයි. විභව නිමැවුම් රේඛාවෙන් පෙන්නුම් කරනුයේ දිගු කාලීන ආර්ථික වෘද්ධියේ හැසිරීම යි.

ClassWork LK

<u>නිමැවුම් පරතරය</u>

විභව නිමැවුම් මට්ටම හා සැබෑ නිමැවුම් මට්ටම් අතර වෙනස නිමැවුම් පරතරය යි.

සාර්ව ආර්ථික අරමුණු කරා ළඟා වීමට නිමැවුම් පරතරය අවම කර ගැනීම වැදගත් වේ.

ClassWork.LK

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති

සාර්ව ආර්ථික අරමුණු කරා ආර්ථිකය මෙහෙයවීමට ගනු ලබන ක්‍රියාමාර්ග සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ලෙස හැඳින්වේ.

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පහත දැක්වේ.

- මූල්‍ය ප්‍රතිපත්ති
- පිස්කල් නැතහොත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති
- සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්ති
- ආදායම් ප්‍රතිපත්ති
- ඍජු පාලන ප්‍රතිපත්ති
- විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති

ClassWork.LK

මූල්‍ය ප්‍රතිපත්තිය

මූල්‍ය ප්‍රතිපත්තිය මගින් සිදු කරනුයේ මුදල් සැපයුමට හා පොළී අනුපාතයට බලපෑම් කිරීම යි. මුදල් සැපයුම හා පොළී අනුපාතය වෙනස් කිරීම මගින් නිෂ්පාදනය, පාරිභෝජනය, ඉතිරි කිරීම්, ආයෝජන, මිල මට්ටම, ආදි විචල්‍යවලට බලපෑම් කළ හැකි ය.

මූල්‍ය ප්‍රතිපත්ති සඳහා භාවිත කරන උපකරණ

- මහ බැංකු පොළී අනුපාතිකය
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය
- විවට වෙළෙඳපොළ කටයුතු

ClassWork.LK

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කෙරනුයේ මහ බැංකුව විසිනි.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යනුවෙන් හඳුන්වන්නේ පිස්කල් ප්‍රතිපත්තිය යි. රාජ්‍ය ආදායම හා රාජ්‍ය වියදම වෙනස් කිරීම මගින් සාර්ව ආර්ථික විචල්‍යයන්ට බලපෑම් කිරීම මගින් සාර්ව ආර්ථික අරමුණු කරා ළඟා විය හැකි ය.

පිස්කල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන උපකරණ

- රාජ්‍ය වියදම්
- රාජ්‍ය බදු
- රාජ්‍ය ණය

ClassWork.LK

පළමු මස
හෝමිලේ...
2022
ADVANCED
LEVEL
ECONOMICS
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු
27
ලියාපදිංචි වීමට :-
076 36 55 550
ඉරිදා
උදෑසන 8.30
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura

ClassWork.LK